# ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගය ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජීය, ආර්ථික සාධක

**එම්. පී. ඒ. ඩබ්ලිව්. පතිරාජ**[1]

**සංක්ෂේපය**

නිදන්ගත වකුගඩු රෝගය ලෝක ව්‍යාප්ත ප්‍රධාන සෞඛ්‍යය ගැටලුවක් ව පවතියි. මෙම රෝගයට නිශ්චිත හේතුවක් සොයා ගැනීමට නොහැකි වූ හෙයින් නොදන්නා හේතුවක් නිසා හටගත් නිදන්ගත වකුගඩු රෝගය ලෙස හඳුන්වනු ලැබේ. ක්‍රම ක්‍රමයෙන් වකුගඩුවල ක්‍රියාකාරීත්වය පිරිහෙන අතර කාලයත් සමඟ මෙම අත්දැකීම රෝගියාට පමණක් නොව පවුල්වල සාමාජිකයන්ට ද විශාල වශයෙන් බලපෑමක් සිදු කිරීමට සමත් වී ඇත. මෙම රෝගයට ප්‍රතිකාර ලෙස වකුගඩු බද්ධ කිරීම හා රුධිර කාන්දුකරණය කිරීම සිදුකරන අතර මේ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වී ඇත. නිදන්ගත වකුගඩු රෝගය ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ පසුගිය දශක කිහිපය තුළ පවතින ප්‍රධාන සෞඛ්‍යය ගැටලුවක් බවට පත්ව ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ, නිදන්ගත වකුගඩු රෝගය උතුරු මැද පළාතේ ව්‍යාප්ත වීම සඳහා බලපාන සමාජයීය ආර්ථික සාධක මොනවාද යන්න හඳුනා ගැනීමය. අධ්‍යයනයේ අරමුණ වන්නේ, වකුගඩු රෝගයේ ව්‍යාප්තිය සඳහා බලපාන ප්‍රධාන සාධක රාශියක් පවතින බව පෙන්වා දීමය. මෙහිදී පර්යේෂකයා විසින් යෝග්‍යය පර්යේෂණ ක්‍රමවේදයක් අනුගමනය කරන ලදි. සසම්භාවී නියදි ක්‍රමය යටතේ, වැඩිම වකුගඩු රෝගීන් ප්‍රමාණයක් වාර්තා වන අනුරාධපුර ප්‍රධාන රෝහලේ වකුගඩු ඒකකය මඟින් පවත්වන වකුගඩු සායනය සඳහා පැමිණෙන රෝගීන් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. සායනය සඳහා පැමිණි රෝගීන් 200 ක් අතරින් රෝගීන් 100 අහඹු ලෙස තෝරාගත් අතර ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය අනුගමනය කරමින් දත්ත රැස් කරගන ඇත. දත්ත දායකයින් ලබා දුන් පිළිතුරුවල සමස්තය සංඛ්‍යාත්මකව පෙළගස්වා පිළිතුරු සදහා වූ හේතු පදනම් කරගනිමින් SPSS මෘදුකාංගය මඟින් විස්තරාත්මක දත්ත විශ්ලේෂණයක් සිදු කර ඇත. දියුණු රටවල නිදන්ගත වකුගඩු රෝගය සඳහා බලපාන ප්‍රධාන සාධක ලෙස ස්ථුලතාවය , අධික රුධිර පීඩනය, දියවැඩියාව වැනි සාධක හඳුනා ගෙන ඇති අතර ලංකාවේ කෘෂිකාර්මික ආර්ථික රටාවක් පවතින බැවින්, කෘෂිකාර්මික ක්‍රියා කලාපයන්ගේ ප්‍රතිඵලයක් ලෙස රෝගයේ ව්‍යාප්තිය සිදු වී ඇති බව පර්යේෂකයන්ගේ අදහසයි. මෙම අධ්‍යයනයේ අවසන් නිගමනය වන්නේ, කෘමිනාශක භාවිතය, ෆ්ලෝරයිඩ් අඩංගු ජලය පානය කිරීම, බැර ලෝහ ශරීරගත වීම, පොහොර භාවිතය, ආසනික්, විජලනය, මධ්‍යසාර භාවිතය, දුම් පානය කිරීම වැනි සාධක රෝගයේ ව්‍යාප්තියට බලපාන ප්‍රබල සාධක වශයෙන් හඳුනා ගෙන ඇත. මෙහි අවසාන ප්‍රතිඵලය ලෙස ස්ත්‍රී පුරුෂ බව, සමාජයීය සාධක, ආර්ථික සාධක, ආහාර රටා, ජීවන රටා, ජල මූලාශ්‍ර යන කරුණු මෙම රෝගයට හේතු සාධක වන බව පෙන්වා දිය හැකිය. මේ අනුව වකුගඩු රොගයේ ව්‍යාප්තිය සඳහා බලපාන සාධක රාශියක් පවතින බව පෙන්වා දිය හැකි ය.

**මුඛ්‍ය පද :** නිදන්ගත වකුගඩු රෝගය, වකුගඩු රොගයේ ව්‍යාප්තිය, බෝ නොවන රෝග, ආහාර රටා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ayeshani128@gmail.com